# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 අගෝස්තු මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016.08.15 දින නිකුත් කරන ලදී)**

## ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන

**ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද; තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හා; ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථීක කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 13.00 තැපැල් ගාස්තුව : රු. 15.00

# ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන

එල්.ඩී.— ඕ. 1/2016

**ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් හා උපාය මාර්ගයක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ද; තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

**පූර්විකාව.**

දෙදහස් පහළොව වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් විසින් තිරසාර සංවර්ධන ඉලක්ක දාහතක් හා ආශ්‍රිත අරමුණු එකසිය හැට නවයක් සම්මත කර ගනු ලැබ ඇති හෙයින් ද;

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ උපාය මාර්ගයක් නිර්මාණය, සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීමට ද, වගකිව යුතු සියලු නියෝජ්‍යායතනවලට පහසුකම් සැලසීමට සහ ප්‍රගතිය සොයා බලා ඒවා අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකාව අදහස් කරන හෙයින් ද;

ගෝලීය මට්ටමේ අභිලාෂයන්හි මග පෙන්වීමෙන්, එහෙත් ජාතික යහපත සහ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව විසින් ස්වකීය ජාතික ඉලක්ක සකස් කර අදාළ ආර්ථික, සාමාජීය හා පාරිසරික ක්ෂේත්‍රවල දැනට ක්‍රියාත්මකවන ක්‍රියාවලියේ දී ජාතික සැලසුම් ක්‍රියාවලියට, ප්‍රතිපත්තිවලට හා උපාය මාර්ගවලට ඉහත කී තිරසාර සංවර්ධන ඉලක්ක දාහත ඇතුළත් කිරීමට අදහස් කරන හෙයින් දඃ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 2016 අංක  දරන ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මේ පනතේ අරමුණු.**

**2.** මේ පනතේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු යඃ-

(අ) මේ පනතේ 11 වන වගන්තියට අනුකූලව තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය පිළියෙල කරන බවට සහතිකවීම හා තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික රාමුවක් සැකසීම;

2—PL 010091 -425 (2016/07)

(ආ) ස්වාභාවික, සාමාජීය හා ආර්ථික සම්පත් පරිසර හිතකාමී ලෙස සහ කාර්යක්ෂම ලෙස භාවිත කරන බවට සහතික වීම;

(ඇ) ආණ්ඩුවේ සියලු තීරණ ගැනීමේ දී පාරිසරික, ආර්ථික හා සාමාජීය කරුණු සමග ඒකාබද්ධ වන පරිදි තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම ; සහ

(ඈ) මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවලට අනුකූලව උපාය මාර්ග සකස් කිරීම.

I වන කොටස

**තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම**

**3.** (1) (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තිරසාර සංවර්ධන සභාව නම් වූ සභාවක් මේ පනතේ කාර්ය සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

තිරසාර සංවර්ධන සභාවක් පිහිටුවීම.

(2) සභාව, මේ වගන්තිය මගින් ඊට ලබා දී ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සභාව විසින් ද, ඊට එරෙහිව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

**4.** (1) සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු යː-

සභාවේ සංයුතිය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් තිදෙනෙකු, එනම්—

(i) තිරසාර සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) ජාතික ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(iii) පරිසර විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්; සහ

(ආ) පහත දැක්වෙන පරිදි ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" ලෙස සඳහන් කරනු ලබන) තවත් සාමාජිකයන් අට දෙනෙක් ː-

(i) ජනාධිපතිවරයාගේ කැමැත්ත අනුව ඔහු විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(ii) අග්‍රාමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙක්;

(iii) තිරසාර සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(iv) පළාත් සභා විසින් නම් කරනු ලබන තැනැත්තන් නව දෙනෙකුගෙන් තෝරා ගනු ලබන සාමාජිකයන් තුන් දෙනෙක්; මේ අනු-ඡේදය යටතේ පත් කරනු ලබන එම සාමාජිකයන්ගේ ධුර කාලය අවසන්වීමේ දී පළාත් සභා විසින් නම් කරන ලද ඉතිරි තැනැත්තන් සංඛ්‍යාව වරින් වර දෙවන හා තුන්වන පත් කිරීම් සඳහා සලකා බැලිය යුතු ය.

(2) ජනාධිපතිවරයා විසින් සභාවේ සාමාජිකයන් අතරින් සභාවේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය.

(3) සෑම පත්කළ සාමාජිකයකුට ම පරිසර විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රීය හෝ වෘත්තීය සුදුසුකම් ද, ඒ පිළිබඳ මනා පළපුරුද්දක් ද තිබිය යුතු අතර තිරසාර සංවර්ධනයට අදාළව විශේෂිත පළපුරුද්දක් තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනු-ඡේදය යටතේ පත් කළ සාමාජිකයන් හැර සෙසු සෑම පත්කළ සාමාජිකයෙක් ම මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළ හොත් මිස, පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනු-ඡේදය යටතේ සෑම පත්කළ සාමාජිකයෙක් ම මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස්කළ හොත් මිස, තමා පත් කරනු ලැබූ දින සිට අවුරුදු එකක කාලයක් ධුරය දැරිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(6) ජනාධිපතිවරයා විසින් අවශ්‍ය යයි සළකනු ලබන්නේ නම්, තත් කාර්යය සඳහා හේතු දක්වා යම් පත්කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(7) යම් පත්කළ සාමාජිකයකුට කවර හෝ අවස්ථාවක දී වුව ද, තත් කාර්ය සඳහා ජනාධිපතිවරයා අමතන ලිපියක් ලියාපදිංචි තැපෑලෙන් යැවීම මගින් සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(8) යම් පත්කළ සාමාජිකයකු මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ඔහුගේ ධුරය හිස්වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන එම සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය. එසේ පත් කරනු ලබන යම් සාමාජිකයකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ නොගෙවී ඉතිරි වී ඇති ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) යම් පත්කළ සාමාජිකයකු රෝගාතුර වීම, අබලතාව හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම යන හේතු මත මාස තුනකට නොඅඩු කාලයක් සඳහා තම ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එසේ නොහැකිවීම පිළිබඳව ජනාධිපතිවරයා වෙත ලිඛිතව දැනුම් දීම එම සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එම තොරතුරු ලැබීමේ දී ජනාධිපතිවරයා විසින් (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ ගණපූරණය සහ රැස්වීම්.

**5.** (1) සභාවේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(2) සභාපතිවරයා, සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විට, තිරසාර සංවර්ධන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා වූ සියලු ප්‍රශ්න එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වන අවස්ථාවක සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, සභාවේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය හා එම රැස්වීම්වල සිදුකරනු ලබන කටයුතු සභාව විසින් විධිමත් කරනු ලැබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු බව.

**6.** සභාවේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ සභාවේ සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම හේතුවෙන් පමණක් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

**7.** මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයට හා එවැනි අනුප්‍රමාණ අනුව සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයකු වීම සඳහා වූ නුසුදුසුකම්.

**8.** 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ බුන්වත් භාවයට පත් වූ තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත්කර ඇත්නම් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශයට පත්කර ඇත්නම්;

(ඈ) මාස හයකට අඩු නොවන කාලයකට බන්ධනාගාර ගත කළ හැකි චරිත දූෂණ වරදකට වරදකරු වී ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් පනවනු ලැබූ බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයක් අනුව බන්ධනාගාරගතව සිටින්නේ නම් හෝ එසේ සිටියේ නම්;

(ඊ) සභාවේ සාමාජිකයකු ලෙස සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී අහිතකර බලපෑමක් ඇතිවිය හැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් ඔහුට ඇත්නම්,

ඔහු සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

සභාවේ මුද්‍රාව.

**9.** (1) සභාවේ මුද්‍රාව, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු ය.

(2) සභාවේ මුද්‍රාව සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සභාවේ අවසරය ඇතිව මිස සහ තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් ලෙස සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් කරන සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සභාවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු ය.

(4) සභාවේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ නාමලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

**10.** සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය පහත දැක්වෙන පරිදි වේ:-

(අ) තිරසාර සංවර්ධනයට අදාළ ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර බැඳීම් සාධනය කර ගැනීමට පහසුකම් සැලසීම;

(ආ) අදාළ සියලුම පාර්ශවකරුවන් සහ පළාත් සභා නවය විමසා සහ ඒවායේ එකඟත්වය ඇතිව තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය සකස් කිරීම හා ඒවා අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ විට, තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය සමාලෝචනය කර යාවත්කාලීන කිරීම;

(ඈ) නව සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අමාත්‍යාංශවලට, පළාත් සභාවලට හා ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජ්‍යායතනවලට තිරසාර සංවර්ධනයට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ඉ) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම පිළිබඳ යාන්ත්‍රණ සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීම සහ නියාමනය කිරීම;

(ඊ) යම් නිශ්චිත කරුණක් අධ්‍යයනය කිරීම සඳහා විශේෂඥ කමිටු පත් කිරීම;

(උ) තිරසාර සංවර්ධන ප්‍රමිති සහ පරිසර පිය සටහන් දර්ශක හඳුනාගැනීම;

(ඌ) පර්යේෂණ හා සංවර්ධනය ද, නව සොයා ගැනීම් ද, අධ්‍යාපනය හා දැනුවත් කිරීම ද, ඇතුළුව තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(එ) තිරසාර සංවර්ධනයට අදාළ යාන්ත්‍රණ, විගණන සහ වෙනත් සියලු කරුණු හඳුනාගෙන, හඳුන්වා දී ඒවා අනුගමනය කිරීම;

(ඒ) යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ ලබාදීම;

(ඔ) යම් රාජ්‍ය බැංකුවක ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඕ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම:

එසේ වුව ද, සභාවට ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය සභාව විසින් ලබාගත යුතු ය;

(ක) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීම; සහ

(ග) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ණයට ගැනීම.

## II වන කොටස

### තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය.

11. (1) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය තිරසාර සංවර්ධන ඉලක්ක සහ ආශ්‍රිත අරමුණුවලට අනුකූල විය යුතු ය.

(2) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය අවුරුදු පහළොවක කාලයක් සඳහා විය යුතු ය.

(3) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය සභාව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව ඊට සංශෝධන ද ඇතුළත් කර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

(4) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය අනුමත කිරීම සඳහා අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපාය මාර්ගය පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලැබුවහොත්, එම අනනුමතයේ දින සිට එය පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(6) (4) වන උපවගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමතය ප්‍රදානය කිරීමෙන් පසු එම තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය, තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය බවට පත් වේ.

(7) තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට හා උපාය මාර්ගයට අනුකූලව ක්‍රියා කිරීම සෑම අමාත්‍යාංශයක ම, දෙපාර්තමේන්තුවක ම, පළාත් සභාවක ම, පළාත් අමාත්‍යාංශයක ම, පළාත් දෙපාර්තමේන්තුවක ම හා පළාත් පාලන ආයතනයක ම කාර්යභාරය විය යුතු ය.

අමාත්‍යාංශ යනාදී ආයතනවල තිරසාර සංවර්ධන උපාය මාර්ග.

**12.** (1) පාර්ලිමේන්තුව විසින් 11 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ගය අනුමත කරනු ලබන දින සිට අවුරුදු එකක කාලයක් ඇතුළත සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක්, පළාත් දෙපාර්තමේන්තුවක් සහ පළාත් පාලන ආයතනයක් විසින් ම තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට හා උපාය මාර්ගවලට අනුව ස්වකීය විෂයය පථයට අදාළ තිරසාර සංවර්ධන උපාය මාර්ග සකස් කර ගත යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද තිරසාර සංවර්ධන උපාය මාර්ග පිළිබඳ ප්‍රගති වාර්තාවක් සෑම අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් අමාත්‍යාංශයක්, පළාත් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ම ඉදිරිපත් කළ යුතු ය.

පාරිසරික හා සමාජීය විගණන.

**13.** (අ) නව සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ පාරිසරික හා සමාජීය විගණනයක් සිදු කිරීමට; සහ

(ආ) නව සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීමේ දී පාරිසරික හා සමාජීය සුරක්ෂිතයන් තහවුරු කිරීමට,

සෑම අමාත්‍යාංශයක් ම, දෙපාර්තමේන්තුවක් ම, පළාත් සභාවක් ම, පළාත් අමාත්‍යාංශයක් ම, පළාත් දෙපාර්තමේන්තුවක් ම සහ පළාත් පාලන ආයතනයක් විසින් ම කටයුතු සැලැස්විය යුතු ය.

අමාත්‍යාංශ ආදියේ වාර්ෂික වාර්තා.

**14.** සෑම අමාත්‍යාංශයක ම, දෙපාර්තමේන්තුවක ම, පළාත් සභාවක ම, පළාත් අමාත්‍යාංශයක ම, පළාත් දෙපාර්තමේන්තුවක ම සහ පළාත් පාලන ආයතනයක ම වාර්ෂික වාර්තාවේ තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපාය මාර්ගයට අනුකූල වීම පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය.

## III වන කොටස

### සභාවේ කාර්ය මණ්ඩලය

සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

**15.** (1) සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු යම් තැනැත්තකු අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔහු සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) සභාවේ සියලු රැස්වීම්වලට පැමිණ සිටීමට සහ එම රැස්වීම්වල කටයුතු පැවැත්වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම් ඇති නමුත් එම රැස්වීම්වල දී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නැත.

(3) සභාව කාර්යක්ෂම ලෙස ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය සභාව විසින් තීරණය කළ යුතු අතර, මේ පනතේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) සභාවේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා සභාවේ සියලු නිලධරයන්ගේ හා සේවකයන්ගේ පරිපාලනය ද ඇතුළත් ව සියලු කටයුතු පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

(5) අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා තත්කාර්ය සඳහා හේතු දක්වා අමාත්‍ය මණ්ඩලය විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

තාවකාලිකව අධ්‍යක්ෂ ජනරාල්වරයා නොපැමිණීම.

**16.** රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා අධ්‍යක්ෂ ජනරාල්වරයාට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් සභාවේ එකඟත්වය ඇතිව ඔහු නොපැමිණෙන කාලය තුළ ඔහුගේ වැඩ බැලීම සඳහා සභාවේ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**17.** (1) සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා, සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත්, එවැනි ම කැමැත්ත ඇතිව ඔහු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හෝ ඔහු සම්බන්ධ හෝ අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් ගිවිසුමක් යටතේ යම් නිශ්චිත කාලයක් සඳහා රජයට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් සභාවට සේවය කරන යම් කාල සීමාවක් එම ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා එම තැනැත්තා විසින් රජයට කරන ලද සේවයක් ලෙස සළකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල හෝ උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් සභාවේ කාර්ය මණ්ඩලයට පත්කිරීම.

**18.** (1) සභාවේ ඉල්ලීම පරිදි රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයෙක් හෝ සේවකයෙක් එම නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව සභාව විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව සභාව සහ අදාළ රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟ වන විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළු වෙනත් නියම හා කොන්දේසි මත, එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) සභාවේ ඉල්ලීම පරිදි යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු එම නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව සභාව විසින් තීරණය කරනු ලබන කාල සීමාවක් සඳහා සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, සභාව සහ එම ප්‍රධාන විධායක නිලධරයා එකඟ වන විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම් ඇතුළු වෙනත් නියම හා කොන්දේසි මත සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(3) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

**19.** (1) සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම.

**20.** 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සභාවේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය අභිනියෝජනය.

**21.** (1) සභාව විසින්, ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලබන කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ සභාවට ඇති බලතල, කර්තව්‍ය සහ කාර්යවලින් කිසිවක් සභාපතිවරයාට හෝ සභාවේ සාමාජිකයකුට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරනු ලැබිය හැකි ය. සභාව විසින් නිකුත් කරනු ලබන විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව සභාපතිවරයා හෝ එම සාමාජිකයා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා එම බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පැවරීමක් කරනු ලැබුව ද, එය නොතකා සභාව විසින් එසේ පවරන ලද බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හෝ කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයාගේ විධාන.

**22.** මේ පනත යටතේ සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට හා කිරීමට අදාළව අමාත්‍යවරයා විසින්, කලින් කළ, සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන නිකුත් කළ හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම සභාවේ කාර්ය වන්නේ ය.

සභාවේ සියලු සාමාජිකයන් ආදීන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**23.** සභාවේ සියලු සාමාජිකයන්, සහ නිලධරයන්, සේවකයන් සහ නියෝජිතයන් (19 වන අධිකාරය වූ) දණ්ඩනීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සළකනු ලැබිය යුතු ය.

**24.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**25.** (1) යම් අධිකරණයක සභාව විසින් හෝ ඊට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව විසින් දරන ලද යම් වියදමක් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සභාව වෙත ගෙවන ලද හෝ අයකර ගනු ලැබූ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

වියදම් සභාවේ අරමුදලින් ගෙවිය යුතු බව.

(2) මේ පනත යටතේ සභාවේ යම් සාමාජිකයකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා, යම් නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඔහුට එරෙහිව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එම ක්‍රියාව සද්භාවයෙන් කළ බවට අධිකරණය තීරණය කළ හොත් සහ එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් ඒ මුදල අයකර ගනු ලැබුවේ නම් මිස, එකී වියදම ඒකාබද්ධ අරමුදලින් දරනු ලැබිය යුතු ය.

**26.** (1) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා ද, විශේෂයෙන් ම පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් රීති සාදනු ලැබිය හැකි යඃ-

නියෝග.

(අ) ව්‍යාපෘති අනුමත කරන නියෝජ්‍යායතනවලට මාර්ගෝපදේශ නිකුත් කිරීම;

(ආ) තිරසාර සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමන යාන්ත්‍රණ සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලි;

(ඇ) තිරසාර ප්‍රමිති සහ පාරිසරික පිය සටහන් දර්ශක;

(ඈ) ව්‍යාපෘති පිළිබඳ තොරතුරු රැස්කර මැණ බැලීම පිළිබඳ යාන්ත්‍රණ;

(ඉ) උචිත සමාජ සහ පාරිසරික විගණන පැවැත්වීම සඳහා වූ උපමාන;

(ඊ) සංවර්ධන ව්‍යාපෘති හා සංකීර්ණ ව්‍යාපෘති වර්ග ; සහ

(උ) ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජ්‍යායතන විසින් සංකීර්ණ ව්‍යාපෘති අනුමතය සඳහා කරනු ලබන ඉල්ලීම් සමාලෝචනය කිරීම සඳහා වූ යාන්ත්‍රණ.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම අමාත්‍ය මණ්ඩල අනුමතය ලබා ගැනීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් පසු දිනයක සිට එම නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ - අර්ථ නිරූපණ.

"අමාත්‍යවරයා" යන්නෙන්, තිරසාර සංවර්ධන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජ්‍යායතන" යන්නට, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් අමාත්‍යාංශ, පළාත් දෙපාර්තමේන්තු සහ පළාත් පාලන ආයතන සහ සියලු රජයේ සහ පළාත් සභාවල නියෝජ්‍යායතන ඇතුළත් වේ;

"තිරසාරභාවය" යන්නෙන්, යම් දෙයක්, ක්‍රියාවක්, ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාවලියක් අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව අදහස් වේ;

"තිරසාර සංවර්ධනය" යන්නෙන්, අනාගත පරපුරේ අවශ්‍යතාවන් සපුරාලීමේ හැකියාවට අවදානමක් ඇති නොවන පරිදි වර්තමාන පරපුරේ අවශ්‍යතා සපුරාලන සංවර්ධනය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**28.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.